# 7

# අත්තහාරත් 1

## ජලය හා නජීසය

පිරිසිදුකම ඊමානයේ කොටසකි. යන්න නබි වදනකි. ඉස්ලාම් පිරිසිදුකම අගයන ආගමකි. එය පිරිසිදුව සිටින්නන්ට කැමැති ය. ඉස්ලාමයේ පිරිසිදු කම ඉබාදතයන් හා බැඳී පවතී. අර්කානුල් ඉස්ලාමයේ අඩංගු ඉබාදත් සහ අනෙකුත් දේ පිළිගැනීමට ඇති කොන්දේසිය වශයෙන් ඉස්ලාම් සළකන්නේ පිරිසිදුකම ය. එමනිසා අල්ලාහ් ද පිරිසිදුව සිටින අයට කැමැති බව අල්කුර්ආනය පවසයි. අභ්‍යන්තරව මෙන්ම බාහිරව ද පිරිසිදුව තිබීම අත්තහාරත් නමින් හැඳින් වේ.

ඊර්ෂ්‍යාව, වංචාව, ආඩම්බරකම, අහංකාරකම, ලෝබකම, මුනිච්ඡාව, කපටි කම ආදි පහත් ගති ගුණවලින් අප අපගේ සිත පිරිසිදු කර ගැනීම අභ්‍යන්තර පාරිශුද්ධතාව නම් වේ. අල්කුර්ආන් පාරායනය, දික්ර් කිරීම,තස්බිහ් කිරීම, පව් සමාව ඇයැදීම, සලවාත් උසුරීම වැනි ඒවා සිත පිරිසිදු කරන යහක්‍රියාවන් ය.

නජීස්වලින් සිරුර, ඇඳුම්, පදිංචි ස්ථානය, වටාපිටාව යනාදිය පිරිසිදුව තබා ගැනීම බාහිර පිරිසිදුකම නම් වේ. දෛනික කටයුතුවල දී පිරිසිදුකම රැකගැනීම අනිවාර්ය වන්නේ ය. පිරිසිදුකම රැකීමට මිනිසා නජීස්වලින් වැළකී සිටිය යුතු ය. එම නිසා නජීසය වළක්වන ආකාරය පදනම් කරගෙන එය කොටස් තුනකට බෙදයි.

1. දැඩි නජීස්

2. සමාන්‍ය නජීස්

3. පහසු නජීස්

### දැඩි නජීස්

සුනඛයන්ගේ හා සූකරයන්ගේ කෙළ මෙයට උදාහරණ වන්නේ ය. මෙම නජීසය පිරිසිදු කිරීම සඳහා හත් වතාවක් ජලය යොදා සේදිය යුතුයි. එයින් මුල් වතාවේ දී පිරිසිදු වැලි භාවිතා කළ යුතු ය.

### සාමාන්‍ය නජීස්

ලේ, වමනය, මත්පැන්, මළ, මූත්‍ර, කුණු කෙළ යනාදිය මෙම වර්ගයට අයත් ය. මෙම නජීසය පිරිසිදු කරන අවස්ථාවේ දී නජීස් වැදුණු ස්ථානය පළමුව පිරිසිදු ජලයෙන් සේදිය යුතු ය. මේ සඳහා සබන් හෝ සෝධන කුඩු යොදා ගැනීමට පුළුවන.

### පහසු නජීස්

වයස දෙක අසම්පූර්ණ මව් කිරි පමණක් ආහාර වශයෙන් ගන්නා කුඩා දරුවන්ගේ මුත්‍රා මෙම වර්ගයට අයත් ය. මෙය පිරිසිදු කිරීම සඳහා එය මතට ජලය ඉසීම පමණක් සෑහෙන්නේ ය.

## ජලය හා එහි ආකාර

ජලය අල්ලාහ් විසින් ලබා දෙන ලද දායාදයකි. තමාව පිරිසිදුව තබා ගැනීම සඳහා මිනිසාට ජලය අවශ්‍යය. ජලයේ ස්වභාවය සහ ධාරිතාව පදනම් කරගෙන එය කොටස් තුනකට බෙදයි.

1) මාඋන් තහූර් (අතිපිරිසිදු ජලය)

2) මාඋන් තාහිර් (පිරිසිදු ජලය)

3) මාඋන් නජීස් (අපිරිසිදු ජලය)

### මාඋන් තහූර් (අති පිරිසිදු ජලය)

මෙ වැනි ජලය ස්වභාවයෙන් පිරිසිදු ය. එහෙයින් මෙය අපද්‍රව්‍ය පිරිසිදු කිරීම සඳහා යොදා ගත හැකිය. නෑම, වුලූ කිරීම, බීම, නජීස් පිරිසිදු කිරීම වැනි සියලු අවශ්‍යතා සඳහා මෙය භාවිත කරයි. මෙවැනි ජලයට උදාහරණ වශයෙන් මුහුදු ජලය වැහි ජලය, වැව් ජලය, ගංගා ජලය, උල්පත් ජලය, ළිං ජලය වැනි ජලය සඳහන් කළ හැකි ය.

## මාඋන් තාහිර් (පිරිසිදු ජලය)

මෙවැනි ජලය පිරිසිදු වුව ද අන් දේවල් හෝ අන් අය පිරිසිදු කිරීමට හැකියාවක් නැති එකකි. උදාහරණ වශයෙන් තේවතුර, කෝපි වතුර, තැඹිලි වතුර, පිනිදිය, සිසිල් දිය යනාදිය සඳහන් කළ හැකි ය.

## මාඋන් නජීස් (අපිරිසිදු ජලය)

ලීටර 210 ට අඩු ජලය නජීස් වන ද්‍රව්‍ය මිශ්‍ර වීමෙන් එහි පාට, රසය, සුවඳ වැනි ඒවා වෙනස් වන නිසා මෙම තත්ත්වයට පත්වේ. මෙය කිසිදු අවශ්‍යතාවයක් සඳහා භාවිතා නොකළ යුතු ය. උදාහරණ වශයෙන් මත්පැන් වර්ග, අපජලය, මූත්‍ර යනාදිය සඳහන් කළ හැකි ය.

අභ්‍යාස

1. නජීස්වල ආකාර උදාහරණ සමග ලියා දක්වන්න.
2. පහත සඳහන් ජලවර්ග කුමන වර්ගයට අයත් දැයි හඳුනාගෙන වගුව සම්පූර්ණ කරන්න.

(වර්ෂා ජලය, මත්පැන්, වැව් ජලය, කෝපි, ගංගා ජලය, පිනිදිය, රා, තැඹිලි වතුර,අරක්කු, අප ජලය, තේවතුර)

| අතිපිරිසිදු ජලය | පිරිසිදු ජලය | අපිරිසිදු ජලය |
|---|---|---|
| | | |